ජාතික ඖෂධ නියාමන අධිකාරිය - **2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

-----------------------------------------------------------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ''මනාලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 60 සහ 66 ඡේද ප්‍රකාරව, නිලධාරීන් වෙත නිකුත්කර තිබුණු ආපදා ණය රු.8,796,260 ක් ජංගම සහ ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර දැක්වීම වෙනුවට ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි. එසේම ප්‍රමිතයේ 69 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වගකීමක් ලෙස හෙළිදරව් කළ යුතු සේවක පාරිතෝෂික සඳහා වෙන්කිරීම් රු.2,150,728 ක් ජංගම වගකීමක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි කිරීම් හා හෙළිදරව් කිරීම් ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම් තුළින් සිදු කරන බව. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | පෙර වර්ෂවලදී සිදුවී තිබුණු වැරදි නිවැරදි කිරීම සඳහා වර්ෂය ආරම්භක හිමිකම් ගිණුමේ ශේෂයට රු.52,414,563 ක් ගලපා තිබුණි. නමුත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 හි 49 වගන්තිය ප්‍රකාරව එම වැරදිවල ස්වභාවය (Nature) හෙළිදරව් කර නොතිබුණි. | - එම- | - එම- |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10 ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන නිකුත් කළ දිනට පසුව ඇතිවන සිදුවීම් මූල්‍ය ප්‍රකාශනවලට ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කරන්නේ නම් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත්, ලේඛන සහ කාර්ය ප්‍රවාහ කළමනාකරණ පද්ධතියේ දත්ත හා රහස්‍ය තොරතුරු මකාදමා තිබීම පිළිබඳව හා එයින් ඇතිවී තිබුණු මූල්‍යමය බලපෑමේ ඇස්තමේන්තුවක් හෝ එසේ ඇස්තමේන්තුවක් කළ නොහැකි නම් ඒ බවට ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | - එම- | - එම- |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි 55 ඡේදය ප්‍රකාරව, සේවක පාරිතෝෂිත ගණනය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර තිබුණු නමුත් සේවක පාරිතෝෂිත ගණනය කිරීමේදී එම ප්‍රතිපත්තිය මත පදනම්ව ගණනය කිරීම් සිදුකර නොතිබුණි. තවද අධිකාරියේ රු.2,150,728 ක නිර්වාචිත ප්‍රතිලාභ සැලසුමට අදාළව පැහැදිලිව හඳුනාගත හැකි සැලසුම් වත්කමක් (Plan Asset) පිළියෙල කර නොතිබුණි. | - එම- | - එම- |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් වාහන 03 ක්, සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් වාහන 06 ක් ඇතුළු ජංගම නොවන වත්කම් සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවති ජාතික තත්ත්ව ආරක්ෂණ රසායනාගාරය හා එහි වත්කම් අධිකාරියේ භාවිතයට ස්ථිරව ලබාදී තිබුණු නමුත් එම වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට හා එම වත්කම්වලට අදාළ ක්ෂය වියදම හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | සෞඛ්‍ය අමාත්‍යාංශය සතු වාහන 06 පවරා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව හා අනෙකුත් වත්කම් 2021 වර්ෂයේ අවසන් ගිණුම් තුළ ඇතුළත් කරන බව. | අධිකාරිය සතු නමුත් ගිණුම් ගත කර නැති සියළු වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දින වන විට සෘජුවම බැංකුව වෙත ලැබී තිබුණු රු.2,628,262 ක් හඳුනාගෙන නිසි පරිදි ගිණුම්වල ගැලපීමට කටයුතු නොකර හඳුනා නොගත් තැන්පතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු බැවින් ජංගම වගකීම් ඊට සමාන අගයකින් වැඩියෙන් දැක්වුණි. | සෘජුවම බැංකුව වෙත ලැබෙන තැන්පතු වන බැවින් සෑම මසකම මෙම හඳුනා නොගත් ශේෂ ඇති වන බව හා ඊළඟ මාසයේදී මෙම ශේෂ නිරාකරණය වන බැවින් මෙම වටිනාකම හඳුනා නොගත් තැන්පතු ලෙස ගිණුම් ගත කිරීමට සිදුවන බව. | ගිණුම් කාලච්ඡේදයට අදාළ ආදායම නිවැරදිව හඳුනාගත යුතු අතර ඊට අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට රු.7,113,732 ක උපචිත වියදම් ගිණුම් ගත කර නොතිබුණු බැවින් වර්ෂයේ ලාභය හා ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | නිවැරදි කිරීම් ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම් තුළින් සිදු කරන බව. | ගිණුම් කාලච්ඡේදයට අදාළ වියදම නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බදු වෙන්කිරීම රු.41,648,456 කින් වැඩියෙන් සිදුකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ බදු පසු ලාභය හා 2020 දෙසැම්බර් 31 දිනට ආදායම් බදු වෙන්කිරීම ඊට සමාන අගයකින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | - එම- | ගිණුම් කාලච්ඡේදයට අදාළ ආදායම් බදු වෙන්කිරීම නිවැරදිව සිදුකළ යුතුය. |

### 1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පවත්නා කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් කාර්යාල කාර්ය මණ්ඩලය ප්‍රවාහනයට දිනකට වාහන 03 ක් කුලියට ගැනීමට හා වාහන 03 සඳහා දිනකට රු.20,000 ක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණද, ඊට පටහැනිව දිනකට වාහන 06 ක් ලබාගෙන දිනකට රු.49,500 ක් දක්වා ගෙවීම් කර තිබුණි. ඒ අනුව 2020 මාර්තු මාසයේ සිට 2020 දෙසැම්බර් මාසය දක්වා වූ මාස 10 ක් වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට පටහැනිව රු.4,344,280 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | කොවිඩ් වසංගත තත්වය මත කාර්ය මණ්ඩල ප්‍රවාහනයට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා මූලිකව බස් රථ 2 ක්ද පසුව නිලධාරීන් සේවයට කැඳවීමේ අවශ්‍යතාවය මත බස් රථ 3ක් සහ වෑන් රථ 2ක් දක්වාද පහසුකම් වැඩි කළ බව. | වැඩිපුර ගෙවූ මුදල් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට හෝ ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් එම මුදල අයකර ගැනීමට හෝ කටයුතු කළ යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අත්තිකාරම් ලැබීම් | රු. 72,972,666 | 2020 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ලෙස ලැබී තිබුණු රු.72,972,666 ක්වූ ශේෂයට අදාළ විස්තරාත්මක උපලේඛන හා ලැබීම් විස්තර විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | අදාළ උපලේඛන නොපමාව විගණනය සඳහා ඉදිරිපත් කරන බව. | අදාළ උපලේඛන හා ලැබීම් විස්තර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත | | | |
| (i) 43(2) (අ) සහ (ආ) වගන්ති | ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ඖෂධ සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීමක් සිදුකර ඖෂධ ඇගයීම් කමිටුව විසින් ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ප්‍රකාරව ඖෂධවලට අදාළ ප්‍රතිලාභ, අවදානම්, එම ඖෂධවල තත්ත්වය, ප්‍රත්‍යක්ෂභාවය, ආරක්ෂාකාරී බව, අවශ්‍යතාවය, මිල හා අවශ්‍ය අවස්ථාවලදී එම ඖෂධවල ඖෂධ ආර්ථික විශ්ලේෂණ පිළිබඳව නිශ්චිතව දක්වමින් වාර්තාවක් ඉදිරිපත් කළයුතු වුවද, | 2020 ඔක්තෝබර් 05 දින සිට ලියාපදිංචියට ඉදිරිපත් කරන ලද අයදුම්පත් ඖෂධ ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර ඇගයීමට ලක් කර නිර්දේශ ඉදිරිපත් කරන බව. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එවැනි ඇගයීමක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා, ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ඖෂධ සම්බන්ධ ඉල්ලීම් කිසිවක් කායික, ශල්‍ය, ළමා රෝග, ප්‍රසව හා නාරිවේද ආදී ක්ෂේත්‍ර නියෝජනය කරනු ලබන විශේෂඥ වෛද්‍යවරුන් හා ඖෂධ වෛද්‍යවේදය පිළිබඳ මහාචාර්යවරුන්ගෙන් සමන්විත ඖෂධ ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. ඒ වෙනුවට ඖෂධ ලියාපදිංචියට අදාළ අයදුම්පත් ඖෂධවේදියෙකු විසින් පමණක් ඇගයීම් සිදු කර තවත් ඖෂධවේදීන් තිදෙනකු විසින් එම ඇගයීම නැවත පරීක්ෂා කර තාවකාලික ලියාපදිංචි සහතිකයක් හෝ සම්පූර්ණ ලියාපදිංචි සහතිකයක් ලබාදීමට කටයුතු කර තිබුණු අතර ලියාපදිංචි සහතිකය අදාළ සමාගමට නිකුත් කළ පසු එම ලියාපදිංචි කිරීම් පිළිබඳ තොරතුරු ඖෂධ ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර තිබුණි. | | |
| (ii) 59(4)(ආ) වගන්තිය | ඖෂධ ලියාපදිංචි කිරීමට පෙර ඖෂධයේ තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ජාතික ඖෂධ තත්ත්ව පරීක්ෂණ රසායනාගාරය (NMQAL) වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එපරිදි ඖෂධයේ තත්ත්වය පරීක්ෂා කිරීමට කටයුතු නොකර ඒ වෙනුවට ඖෂධවේදියෙකු විසින් ඖෂධය පිළිබඳ ලේඛනගත තොරතුරු පමණක් ඇගයීමට කටයුතු කර සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ තාවකාලික ලියාපදිංචි සහතික 1,035 ක් සහ වර්ෂ 05 ක් සඳහා නිකුත් කරන සම්පූර්ණ ලියාපදිංචි සහතික 20 ක් වශයෙන් ලියාපදිංචි සහතික 1,055 ක් නිකුත් කර තිබුණි. ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ රසායනාගාරයේ දත්ත අනුව සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ ලියාපදිංචි සහතික ලබාදීම සඳහා පරීක්ෂා කර තිබුණු ඖෂධ මුළු සාම්පල් ගණන 33 ක් පමණක් විය. | සියලු ඖෂධවල තත්ත්වය පරීක්ෂා කිරීම ප්‍රායෝගිකව සිදුකළ නොහැකි බව, ඖෂධ ලියාපදිංචි කිරීමේ හා තත්ත්ව පරීක්ෂණ අංශය වෙත සාම්පල ලබාදීමේ මාර්ගෝපදේශ අනුව තෝරාගත් ඖෂධ පමණක් පරීක්ෂා කරන බව හා Meropenem For Injection, Erythromycin (All Dosage Forms), Thyroxin (All Dosage Forms) යන ඖෂධ සඳහා අනිවාර්යයෙන් තත්ත්ව පරීක්ෂණ සහතික ලබා ගෙන ලියාපදිංචි සහතික නිකුත් කරන බව. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) 74(1) වගන්තිය | පනතේ කාර්ය සඳහා අවසර දෙනු ලබන වෛද්‍ය උපකරණ අමාත්‍යවරයා විසින් කලින් කළ ලැයිස්තුගත කර නොතිබුණි. | ඒසේ ලැයිස්තු ගත කර ගැසට් කිරීම ප්‍රයෝගිකව අපහසු කරුණක් වන බව හා පනත සංශෝධනය කිරීමේදී ඒ බව සලකා බලන බව. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) 109 වගන්තිය | පනතේ සඳහන් ජීවිතයක් බේරාගැනීමට, බෝවන රෝග හෝ වසංගත රෝගයක් පැතිරීම වැළැක්වීමට, ජාතික අවශ්‍යතාවයක් හා ජාතික ආරක්ෂාව වැනි විශේෂිත අවස්ථා ගණයට නොවැටෙන, ලියාපදිංචිය අවලංගුවීම, ලියාපදිංචි සැපයුම්කරුවන් නොසිටීම, ලියාපදිංචි සැපයුම්කරුවන් ලංසු ඉදිරිපත් නොකිරීම වැනි හේතු මත සමාලෝචිත වර්ෂය තුළදී ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 81 ක් නිකුත් කර තිබුණි. ඒ අතරින් එක් ලිපියක්, හෘද, අක්මා, වකුගඩු රෝග හා අධි රුධිර පීඩන වැනි රෝගී තත්ත්වයන්වලදී භාවිතා කරන පිරිවැය රු.2,563,080 ක් වූ Furosemide syrup ඖෂධයේ බෝතල් 6,000 ක තොගය ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා පෞද්ගලික සමාගමක් වෙත නිකුත් කර තිබුණි. එම ඖෂධ තොගයෙන් සියයට 98 ක් රිජ්වේ ආර්යා ළමා රෝහල ඇතුළු රෝහල්වලදී භාවිතා කර අවසන් වූ පසු සිදුකළ රසායනාගාර පරීක්ෂණයකදී ඖෂධය තත්ත්වයෙන් අසමත් බව තහවුරුවී තිබුණි. අදාළ ඖෂධයේ තත්ත්වය පිළිබඳ ලේඛන ඇගයීමක් හෝ සාම්පල් ඇගයීමක් හෝ සිදුනොකර ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි ලබාදීම හේතුවෙන් මෙවැනි තත්ත්වයෙන් අසමත් ඖෂධ රට තුළට ලැබී තිබුණු බවත්, ඒ අනුව තත්ත්වය පිළිබඳ තහවුරුවක් නොමැති ඖෂධ රෝගීන්ට ලබා දෙන බවත්, එමගින් රෝගීන්ට සිදුවන හානිය මැනිය නොහැකි බවත් නිරීක්ෂණය විය. | පනතේ 109 වගන්තිය ප්‍රකාරව හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ ප්‍රකාරව, ඉදිරිපත් කරන අයදුම්පත් අධිකාරිය විසින් ස්ථාපිත විශේෂඥ අනු කමිටුවකට යොමු කොට එහි නිර්දේශ මත අදාළ **ඖෂධ තොගයට පමණක්** ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ නිකුත් කරන බව. | පනතේ සඳහන් විශේෂිත අවස්ථාවලදී පමණක් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කළ යුතුය. |
| (v) 142 වගන්තිය ප්‍රකාරව නිකුත් කර තිබුණු ඖෂධ ලියාපදිංචි කිරීමේ හා බලපත්‍ර ලබාදීමේ නියෝග | | | |
| ❖ නියෝග අංක 4 | ඖෂධ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන සෑම ඉල්ලීමක්ම ලේඛනගත කිරීමට එක් පොදු ලේඛනයක් පවත්වා නොතිබුණි. ඒ හේතුවෙන් ඖෂධ ලියාපදිංචිය සඳහා ඉල්ලුම්පත ලද දිනය, ඉල්ලුම් පත්‍රයේ අංකය, නිෂ්පාදකයාගේ නම, නිෂ්පාදිත රට, බලය ලත් ආනයනකරු, ඖෂධීය නාමය, එම ඖෂධය ඖෂධීය සංයෝගයක් නම් එහි සක්‍රිය සංඝටකවල ඖෂධීය නාමයන්, ඖෂධයේ වෙළඳනාමය, ඖෂධයේ මාත්‍රා ආකාරය, ඖෂධයේ ප්‍රබලතාවය, ඉල්ලුම් පත්‍රයේ වර්ගය (නව හෝ අළුත් | ඖෂධ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ලද සියලුම ඉල්ලීම් වෙන වෙනම ලේඛනගත කරන බව, නව අයදුම්පත් හා ලියාපදිංචිය අලුත් කිරීමට අදාළ කාර්යයන් සඳහා පොදු ලේඛනයක් පරිගණක | නියෝගය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කිරීමක් සඳහා වන අයදුම්පතක්ද යන බව) ඖෂධයේ වර්ගය ආදී වූ විස්තර මෙන්ම ඒ ඒ අයදුම්පත වෙනුවෙන් ලද මුදල් පිළිබඳ විස්තර, ඒ ඒ අයදුම්පත ඖෂධ නියාමන අංශය වෙත ඇගයීම සඳහා ඉදිරිපත් කළ දිනය, ඒ ඒ අංශ විසින් ප්‍රතික්ෂේපිත අයදුම්පත් ප්‍රමාණය හා අනුමත කළ අයදුම්පත් ප්‍රමාණය, ඒ ඒ අංශවල තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතින අයදුම්පත් ප්‍රමාණය, ඒ ඒ අංශ විසින් ලියාපදිංචියට ගත කළ කාලය ආදී වූ තොරතුරු විගණනය සඳහා ලබාගත නොහැකි විය. ඒ අනුව ඖෂධ ලියාපදිංචිය සහ බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය විනිවිදභාවයෙන් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ගත කර භාවිත කිරීම 2021 නොවැම්බර් 01 දින සිට ආරම්භ කළ බව. | |
| | ❖ නියෝග අංක 133 (5) | අධිකාරියට ලැබුණු, අනුමත කරන ලද, ප්‍රතික්ෂේපිත හා අත්හිටුවන ලද හෝ ඉවත් කර ගන්නා ලද අයදුම් පත්‍ර සම්බන්ධයෙන් අදාළ අත්‍යාවශ්‍ය තොරතුරුද සමඟ දත්ත සමුදායක් පවත්වා ගත යුතු වුවද, අධිකාරිය තුළ එවැනි තොරතුරු පද්ධතියක් පවත්වා නොතිබුණි. | ඉදිරියේදී තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීමට කටයුතු කරන බව. | - එම- |
| | ❖ නියෝග අංක 134 හි XXIII වන උපලේඛනයේ 08 ඡේදය | ඡේදයේ සඳහන් ඉලක්කගත සැකසුම් කාලසීමාව තුළ ලියාපදිංචි සහතික නිකුත් කරන බව තහවුරු කරගැනීම හා ඒ බව පරීක්ෂා කිරීම සඳහා තොරතුරු පද්ධතියක් පවත්වා නොතිබුණි. | ඉදිරියේදී තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීමට කටයුතු කරන බව. | නියෝගය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය | අධිකාරිය වෙනුවෙන් අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි. | අභ්‍යන්තර විගණක තනතුරට අදාළ බඳවා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බව හා එම කටයුතු අවසන් වූ පසු අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවන බව. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 10.1 ඡේදය | සති අන්තයන්හි සහ රජයේ නිවාඩු දින රාජකාරිවල නිරතවීම වෙනුවෙන් 1/20 දීමනාව හිමි මාණ්ඩලික නිලධාරියකුට අතිකාල දීමනා ලබාගැනීමට හිමිකමක් නොමැති වුවද, අධිකාරියේ සේවය කරන මාණ්ඩලික නිලධාරීන් විසින් 1/20 දීමනා හා අතිකාල දීමනා යන දීමනා දෙකම ලබා ගෙන තිබුණි. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර තිබුණු 2016 සැප්තැම්බර් 09 දිනැති අංක MH/AD/01/04/12/2016 දරන ලිපියෙහි සඳහන් අනුමැතිය මත මෙම ගෙවීම් සිදු කළ බව. | වැඩිපුර ගෙවූ දීමනා ආපසු අය කිරීමට හෝ ආයතන සංග්‍රහයේ විධි විධානවලට පටහැනිව කටයුතු කළ නිලධාරීන්ගෙන් එම මුදල් අයකර ගැනීමට හෝ |

| | | | |
|---|---|---|---|
| | | | කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>------------------ | | | |
| (i) මුදල් රෙගුලාසි 237(ආ) | එකිනෙක වියදම සම්බන්ධයෙන් ඊට අදාළ විශේෂ සහතික අමුණා නොතිබුණු රු.1,896,284 ක ගෙවීම් වවුචර් 10 ක් සහතික කර තිබුණු බව නියැදි විගණන පරීක්ෂාවකදී නිරීක්ෂණය විය. | සියලුම සහතික ඇතුළත් කර එම ගෙවීම් සහතික කිරීම සඳහා අවධානය යොමු කරන මෙන් අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දුන් බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 371(2)(ආ) හා 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | මාණ්ඩලික නිලධාරියෙකුට ලබාදිය හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.100,000 ක් වුවද, එම සීමාව ඉක්මවා අවස්ථා 12 කදී රු.1,329,200 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණු අතර බොහෝ අවස්ථාවලදී ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම පියවීමට ප්‍රථම නැවත තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. තවද රු.1,961,700 ක තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමකර දින 03 සිට දින 185 ක් දක්වා අතර කාලයක් ප්‍රමාදවී පියවා තිබුණි. | එම විෂය සම්බන්ධයෙන් නිලධාරියෙකු අනුයුක්ත කර එම අඩුපාඩු නිවැරදි කිරීමට අවශ්‍ය අභ්‍යන්තර දැනුවත් කිරීම් කළ බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) මුදල් රෙගුලාසි 128(1)(ඉ), 507,756, 757,758, 770 හා 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය | ගණන්දීමේ නිලධාරී විසින් සෑම මුදල් වර්ෂයකම දෙසැම්බර් 15 දිනට ප්‍රථම සමීක්ෂණ මණ්ඩල පත්කිරීමට හා එහි වාර්තා ඊලඟ වර්ෂයේ මාර්තු 17 දිනට පෙර ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත පිටපතක් සහිතව විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු වුවද, අධිකාරිය පිහිටවූ 2015 වර්ෂයේ සිටම මුළු පිරිවැය රු.55,492,978 ක්වූ ජංගම නොවන වත්කම් සමීක්ෂණය කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්‍ෂණය පැවැත්වීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව හා 2022 වර්ෂය තුළදී සමීක්ෂණ වාර්තා හැකි ඉක්මනින් විගණකාධිපති වෙත ඉදිරිපත් කරන බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv) මුදල් රෙගුලාසි 1645 (අ) හා (ඉ) | අධිකාරිය විසින් පාවිච්චි කරන වාහන 09 ක ලොග් සටහන් පොත් පවත්වා නොතිබුණු අතර වාහන ලේඛනයක් පවත්වාද නොතිබුණි. | මේ වන විට වාහන ලොග් පොත් පවත්වාගෙන යාමට හා වාහන ඉන්වෙන්ට්‍රි ලේඛනයක් පැවැත්වීමට කටයුතු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය | අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අවධානය යොමු කරමින් ප්‍රසම්පාදන සැලැස්ම විධිමත්ව පිළියෙල කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | භාණ්ඩාගාර චක්‍රලේඛ<br>-------------- | | | |
| | (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | 2020 දෙසැම්බර් 31 දිනට පැවති පිරිවැය රු.91,211,454 ක්වූ දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | මේ වන විට ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කරමින් පවතින බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම තම ආයතනය යටතේ වන සියලුම වත්කම් පිළිබඳව නිවැරදිව තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළයුතු අතර එම කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා සෑම ආයතනයක් විසින්ම සුදුසු නිලධාරියකු නම් කළ යුතු වුවද, අධිකාරිය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2020/2021 වර්ෂවලදී පැවති සියලුම වත්කම් පිළිබඳව නිවැරදිව තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීමට හා සම්බන්ධීකරණ නිලධාරියෙකු පත්කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (උ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩලය සඳහා කෝවිඩ් 19 දිරිදීමනා යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණු අතර සාමාන්‍ය රාජකාරි දින හා නිවාඩු දිනයන් ලෙස නොසලකා රාජකාරියට වාර්තා කරන දිනකට දින 1 ½ බැගින් දීමනා ගණනය කර සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ කාර්යමණ්ඩලය වෙත රු.17,843,781 ක දීමනා ගෙවා තිබුණි. | එම ගෙවීම හා සම්බන්ධ සියලු කරුණු සැලකිල්ලට ගනිමින් 2021 නොවැම්බර් මස සිට මෙම ගෙවීම් අත්හිටවූ බව. | ගෙවූ දීමනා සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට හෝ ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් එම මුදල අයකර ගැනීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 ඡේදය | අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ අයවැය වාර්තාවෙහි පිටපතක් රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය හා විගණකාධිපති වෙත වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර යැවිය යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂය සඳහා වාර්ෂික අයවැය ලේඛනය සකස් කර එය අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතිය සහිතව පිටපත් යැවීමට කටයුතු සූදානම් කර ඇති බව. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (එ) | 2015 ජුනි 17 දිනැති අංක පීඊඩී/03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව හා කිසිදු අනුමැතියකින් තොරව අධිකාරියේ සභාපතිවරයාට සමාලෝචිත වර්ෂය තුළදී කෝවිඩ් 19 දීමනා ලෙස රු.250,886 ක් ගෙවා තිබුණි. | එම ගෙවීම හා සම්බන්ධ සියලු කරුණු සැලකිල්ලට ගනිමින් 2021 නොවැම්බර් මස සිට මෙම ගෙවීම් අත්හිටවූ බව. | ගෙවූ දීමනා සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට හෝ ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් එම මුදල අයකර ගැනීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ඒ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝ මීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත් වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද, අධිකාරිය විසින් භාවිතා කරන වාහන 09 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | සියළුම වාහනවල ඉන්ධන දහනය කිරීම පිලිබඳ පරීක්ෂාවන් සිදු කිරීමට අදාළ උපදෙස් මේ වන විට ලබාදී ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.7 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ දත්ත පද්ධතිය ස්වයංක්‍රීයකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 29 කට වර්ෂ 05 ක කාලයක් සඳහා පෞද්ගලික සමාගමක් වෙත 2018 මැයි 03 දින ප්‍රදානය කර තිබුණි. මෙම ලේඛන සහ කාර්යප්‍රවාහ කළමනාකරණ පද්ධතිය සේවාවක් ලෙස ක්‍රියාත්මක කිරීම Operational Expenditure Financing මොඩලය අනුව ලබා ගෙන ක්‍රියාත්මක කිරීමට ගිවිසුම්ගතවී තිබුණු අතර 2019 ජුනි මාසයේ සිට 2021 මැයි මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත් සමාගම වෙත රු.12,253,328 ක් ගෙවා තිබුණි. නමුත් අදාළ පෞද්ගලික සමාගමේ නොසැලකිල්ලෙන් හෝ හිතාමතා හෝ මෙම දත්ත පද්ධතියට ඇතුළත් කර තිබුණු සමහර තොරතුරු මකා දමා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන විමර්ශන කටයුතු අවසන් වන තෙක් හා 2021 නොවැම්බර් 30 දින වන විටත් සේවාව අක්‍රීය තත්වයට පත්වී තිබුණි. එසේම මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය උපදේශනය, කළමනාකාරීත්වය හා තාක්ෂණික උපදෙස් ලබාගැනීමට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමඟ 2018 ජුනි 25 දින වර්ෂයක කාලයක් සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණද වර්ෂ 05 ක් වූ කොන්ත්‍රාත් කාලයට සමාන්තරව එම ගිවිසුම දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි. තවද කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව, තොරතුරුවල | ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදෙන උපදෙස් අනුව මෙම ව්‍යාපෘතිය නිවැරදි ක්‍රමවේදයකට අනුව වඩාත් විධිමත්ව කිරීමට කටයුතු කරන බව. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, උපදේශනය යන සියලුම කටයුතු විනිවිදභාවයකින්, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස නිවැරදි ක්‍රමවේදයකට අනුව සිදු කළ යුතු අතර එළඹ තිබුණු ගිවිසුම සෑම වර්ෂයක් අවසානයේදීම දීර්ඝ කිරීමට හා ගිවිසුම ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

රහස්‍යභාවය පිළිබඳ සැලකිලිමත් වීමට, මුරපද වෙනස් කිරීමට හෝ තොරතුරු අවභාවිතා කිරීම වැළැක්වීමට කටයුතු කර නොතිබුණු අතර පද්ධතිය ස්වයංක්‍රීයකරණය කිරීමෙන් පසු manual හා automation පද්ධති දෙක සමාන්තරව ක්‍රියාත්මක කර අධිකාරියේ අභ්‍යන්තර වැඩප්‍රවාහය (workflow) පිළිබඳ විගණන පරීක්ෂණයක් (Audit trial) සිදුකර නොතිබුණි. එමෙන්ම ලිපිගොනු කළමනාකරණය, සංරක්ෂණය හා ලේඛන පිටපත් ආරක්ෂිතව වර්ෂ 5ක් දක්වා අදාළ දත්ත සමඟ ගබඩා කිරීමේ හැකියාව, දිනපතා, සතිපතා හා මාසිකව ස්වයංක්‍රීය පිටපත් ලබා ගැනීම හා වෘත්තීමය වගකීම් රක්ෂණාවරණ ලබාගැනීම පිළිබඳව තහවුරුවක් ලබා ගැනීම යන කරුණු කෙරෙහි කළමනාකරණය සැලකිලිමත්වී නොතිබුණු අතර අදාළ දත්ත හා ඇමුණුම් තොරතුරුවල ආරක්ෂිත පිටපත් ලබානොගෙන සමාගම වෙත ගෙවීම් සිදුකර තිබුණි. ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව, පිරිවැය රු.7,558,128 ක් වූ මෙම පද්ධතිය තුළ වූ වත්කම් ප්‍රාග්ධනගත කළ යුතු වුවද, ඒ වෙනුවට එම මුදල ලාභයට එරෙහිව කපාහැර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.673,604,866 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.795,694,791 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.122,089,925 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මුළු ආදායම රු.132,319,772 කින් අඩුවීම හා කොවිඩ් අරමුදල වෙත රු.50,000,000 ක් ප්‍රදානයකර තිබීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් වැඩ නිමකළ ලිපිගොනු ප්‍රවාහනය කර ආරක්ෂිතව ගබඩා කර පවත්වාගෙන යාමේ කොන්ත්‍රාත්තුව 2015 දෙසැම්බර් 01 දින පෞද්ගලික සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත්තුව ආරම්භයේ සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා වූ වර්ෂ 05 ක කාලපරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත්කරු වෙත රු.4,503,080 ක් ගෙවා තිබුණු නමුත් කොන්ත්‍රාත් ගිවිසුමේ 3.3 හා 3.4 ඡේදවල දක්වා තිබුණු පිළිවෙලින් පැවතිය යුතු ගබඩා පහසුකම් පවතින බව හා ගින්නෙන් සිදුවන උවදුරු වැළැක්වීම සඳහා අනුගමනය කළ යුතු සම්මත කොන්දේසි අනුගමනය කරන බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව මුදල් ගෙවා තිබුණු බව ලිපි ගොනු අනුව තහවුරු නොවීය. 2021 ඔක්තෝබර් 23 දින වන | 2016 වර්ෂයේ ගංවතුර හානියෙන් පසු එම ලිපිගොනු වෙනත් ගබඩා 02 ක් වෙත ගෙන ගිය බව, විනාශ වූ ලිපිගොනුවල අනුපිටපත් ලබාගැනීමට කටයුතු කර ඇති බව, ස්ථානීය පරීක්ෂාව මෙම වසරේදී හැකි ඉක්මනින් සිදුකර ලිපිගොනුවල ආරක්ෂාව තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව හා අධිකාරිය විසින් ලිපිගොනු ගබඩාවක් පවත්වාගෙන යාම පිළිබඳව | අධිකාරිය සඳහා ලිපිගොනු ගබඩාවක් ඉදිකිරීම පිළිබඳ අවධානය යොමු කළ යුතු අතර කුලී පදනම මත ලබා ගෙන ඇති ගබඩාවල පහසුකම් පිළිබඳව හා ගිනි උවදුරු හා සම්මත කොන්දේසි අනුගමනය කරන බව තහවුරු කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විටත් ලිපිගොනු ගබඩා කර ඇති ස්ථාන පිළිබඳව, ගබඩා කර ඇති ලේඛනවල ආරක්ෂාව පිළිබඳව හා ඒවා අසුරා තැබීමේ පිළිවෙල පිළිබඳ තොරතුරු කිසිවක් අධිකාරිය සතුව නොතිබුණි. 2016 වර්ෂයේදී එවකට කොන්ත්‍රාත්කරු භාරයේ පැවති ලිපිගොනු කොටසක් ගංවතුරෙන් හානිවී තිබුණු බව සඳහන් කරමින් 2016 මැයි මාසයේ සිට 2017 අප්‍රේල් මාසය දක්වා වූ වර්ෂය වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වෙත මුදල් ගෙවීම් නවතා තිබුණු නමුත් ගංවතුරෙන් හානිවී තිබුණු ලිපිගොනු සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. තවද, 2021 ඔක්තෝබර් 23 දින වන විටත් 2021 වර්ෂය සඳහා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණු නමුත් මෙම වාර්තාවේ දිනය වන විටත් කොන්ත්‍රාත්කරුගේ සේවය ලබා ගනිමින් පැවති අතර වර්ෂ 6 ක් තිස්සේ මේ සඳහා වැයවන පිරිවැය විශ්ලේෂණය කර අධිකාරිය විසින්ම ලේඛණාගාරයක් ස්ථාපිත කිරීම පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. | අවධානය යොමු කර ඇති බව. | |
| (ආ) | 2020 වර්ෂයේදී වෛද්‍ය උපකරණ වෙනුවෙන් ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණු ඩොසියර් 19 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී එම ඩොසියර්වලින් කිහිපයක් අදාළ සමාගම් විසින් 2016 හා 2017 වර්ෂයන්හිදී භාරදුන් ඒවා බවත්, එම ඩොසියර් ඇගයීම් කටයුතු සිදු කර සහතික නිකුත් කිරීමට දින 150 ත් දින 1,395 ත් අතර කාලයක් ගත කර තිබුණු බවත් නිරීක්ෂණය විය. එහිදී ප්‍රධාන විධායක නිලධාරී විසින් ඩොසියර් 451 ක් ඇගයීමට ලබාදීම සඳහා දින 15 ත් දින 181 ත් අතර කාලයක් ගත කර තිබුණු බවත්, වසරකට පමණ පසු බාහිර ඇගයුම්කරුවන්ට ඇගයීම සඳහා ලබාදී තිබුණු බවත්, යම් නිශ්චිත කාලයකින් පසුව එම ඇගයීම් වාර්තා ලබා ගැනීමට හෝ පසුවිපරම් කිරීමට කටයුතු කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් පැවැත්විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී වෛද්‍ය උපකරණ 583 ක් නව ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කර තිබුණු නමුත් 2021 අප්‍රේල් 01 දින වන විටත් ඉන් වෛද්‍ය උපකරණ 149 ක් සඳහා පමණක් ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණු අතර 04 ක් ප්‍රතික්ෂේප කර 02 ක් වෙනුවෙන් තීරණයක් ගෙන නොතිබුණි. ඉතිරි වෛද්‍ය උපකරණ 428 ක් සඳහා ලියාපදිංචිය ලබාදීමට අපොහොසත්වී තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතෙහි 41 (2), 66 (2) හා 87 (2) වගන්ති ප්‍රකාරව, වෛද්‍ය විද්‍යාව, ඖෂධ වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය හෝ වෙනත් අදාළ විෂයයන් පිළිබඳ උපාධියක් සහිත නිලධාරියෙකු, ඖෂධ නියාමන අංශයේ (Medicine Regulatory Division), වෛද්‍ය උපකරණ නියාමන අංශයේ (Medicine Device Regulatory Division) හා | එම අංශයන්හි ප්‍රධානින් ලෙස ඉහළ පළපුරුද්දක් සහිත සෞඛ්‍ය සේවයේ නියුතු ඖෂධවේදීන් කටයුතු කරන බව හා සුදුසුකම් මත අන්තර්ග්‍රහණය කර අවසන් වූ වහාම අධිකාරියේ ස්ථිර කාර්ය | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය තත්ත්වයන් සම්පූර්ණ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සීමාස්ථ නිෂ්පාදන නියාමන අංශයේ (Border Line Production Regulatory Division) ප්‍රධානීන් ලෙස පත්කර නොතිබුණි. | මණ්ඩලයට බඳවා ගන්නා නිලධාරීන් අතරින් සුදුසුකම් ලත් නිලධාරීන් නියාමන කටයුතු සම්බන්ධ අංශයන්හි ප්‍රධානින් ලෙස පත් කිරීමට හැකි වන බව. | |
| (ඉ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 60 (2), 61, 84 (2), 85, 103(2) හා 104 වගන්ති ප්‍රකාරව, අධිකාරිය විසින් ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මඟින් මහජනතාව වෙත දැනුම් දිය යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි. | එම ක්‍රියාවලිය නිතිපතා සිදු නොවූ බව පිලිගන්නා බව හා මින් ඉදිරියට නිතිපතා එය සිදුකරන බව. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ රසායනාගාරය විසින් රසායනාගාරයේ ප්‍රමිතිය සම්බන්ධයෙන් අනුකූලතා තක්සේරු පිළිබඳ සහතිකය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙත 2020 පෙබරවාරි 06 දින අයදුම්පතක් ඉදිරිපත් කර තිබුණු නමුත් විගණිත දිනය වූ 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම ප්‍රමිති සහතිකය ලබාගැනීමට අපොහොසත්වී තිබුණි. තවද අධිකාරිය විසින් වෙනත් ප්‍රමිති සහතික හෝ ලබාගෙන ඇති බව තහවුරු නොකෙරුණි. | ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය විසින් ලබා දුන් උපදෙස් අනුව ඉදිරියේදී පරීක්ෂණාගාරයේ සිදු කළ යුතු පරිවර්තන දැනට සිදු කරමින් පවතින අතර එම අඩුපාඩු සම්පූර්ණ කළ පසු නැවත ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය විසින් පරීක්ෂණාගාරය ඇගයීමකට ලක් කරන බව. | රසායනාගාර ප්‍රමිතිය සම්බන්ධ අනුකූලතා තක්සේරු පිළිබඳ සහතිකය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 72(1) හා 93(1) වගන්ති ප්‍රකාරව, ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම සඳහා පොදු මාර්ගෝපදේශ අධිකාරිය විසින් පිළියෙල කර වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම් කමිටු වෙත ලබාදිය යුතු අතර, 142 වගන්තිය ප්‍රකාරව වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීමේ හා බලපත්‍ර ලබාදීමේ නියෝග පිළියෙල කළ යුතුය. එසේ වුවද, එම මාර්ගෝපදේශ පිළියෙල කර ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණු අතර ලියාපදිංචි කිරීමේ හා බලපත්‍ර ලබාදීමේ නියෝග පිළියෙල කරද නොතිබුණි. | ඖෂධ වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන සහ වෙනත් අදාළ අයිතම ඇගයීම සඳහා පොදු මාර්ගෝපදේශ සියල්ල (එක් එක් අංශ මගින්) පිළියෙල කර, එම මාර්ගෝපදේශ අධිකාරියේ වෙබ් පිටුව හරහා දැනුවත් කර ඇති බව, ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් වරින් වර ලබාදෙන උපදෙස් මෙන්ම ඇගයීම් කමිටුව හරහා සිදු කරන ඇගයීම් කටයුතුද මෙම නියාමන ක්‍රියාවලියටම අයත් බව හා වෙන් වෙන් වශයෙන් මාර්ගෝපදේශ ඒ සඳහා නිකුත් කළ යුතුදැයි සලකා බලා එය නිවැරදි කර ගැනීමට ඉදිරියේදී පියවර ගන්නා බව. | වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම සඳහා පොදු මාර්ගෝපදේශ හා නිෂ්පාදන ලියාපදිංචි කිරීමේ හා බලපත්‍ර ලබාදීමේ නියෝග පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතෙහි 123 වගන්තිය ප්‍රකාරව, අධිකාරිය වෙත ඉදිරිපත් කරන අභියාචනා අසා තීරණය කිරීම සඳහා අභියාචනා කමිටුවක් පිහිටුවා නොතිබුණි. | අභියාචන කමිටුව ගරු අමාත්‍යතුමා විසින් පත්කළ යුතු බැවින් ඒ පිළිබඳව අමාත්‍යතුමාව දැනුවත් කර ඇති බව. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 39 වගන්තිය ප්‍රකාරව, ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ රසායනාගාරය විසින් ඉකුත් වර්ෂයේදී පරීක්ෂා කර තිබුණු සාම්පල් ප්‍රමාණය, එම වර්ෂයේදී ඉදිරිපත් කර තිබුණු මුළු සාම්පල් ප්‍රමාණයෙන් සියයට 60 ක් පමණක් විය. එසේම සමාලෝචිත වර්ෂය තුළදී ඉදිරිපත් කර තිබුණු සාම්පල් 468 කින් සාම්පල් 334 ක් පමණක් පරීක්ෂා කර තිබුණු අතර ප්‍රගතිය සියයට 71 ක් විය. | පරීක්ෂණාගාරය වෙත විශ්ලේෂණය සඳහා ලැබුන සියලුම සාම්පල එම වසර තුළදීම විශ්ලේෂණය කිරීම අපහසු බව, මෙය සෑම වසරකම සිදුවන ක්‍රියාවලියක් වන බව, එම වසරේ ඉතිරි වන සාම්පල වල තත්ත්ව වාර්තා පසුව නිකුත් කරන බව හා 2020 වසරේ ලැබී ඇති සාම්පල 468න් 443ක ඒනම් සියයට 95 ක වාර්තා මේ වන විට නිකුත් කර ඇති බව. | පරීක්ෂාවට භාජනය කරන නියැදි ප්‍රමාණය වැඩි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | අධිකාරිය විසින් බාහිර ආයතනවලින් එකතුකළ අගය මත බදු ප්‍රතිශතය වැඩියෙන් අයකර තිබීම, නිලධාරීන්ගේ වැරදි හා අතපසුවීම් මත එක ගෙවීමක් දෙවරක් සිදුකර තිබීම, නියමිත ගාස්තුව ඉක්මවා ආදායම් රැස්කර තිබීම, ලියාපදිංචිය ඉකුත්වීම නිසා ආනයන බලපත්‍ර නිකුත්කර නොතිබීම, නම් වෙනස්වීම් හා තොග බලපත්‍ර වලංගු කාලය අවසන්වීම නිසා ප්‍රවාහන බලපත්‍රය නිකුත් කළ නොහැකිවීම ආදී වූ කරුණු පදනම් කර ගෙන 2019 හා 2020 වර්ෂවල අවස්ථා 107 කදී රු.6,464,208 ක ආදායම් ආපසු ගෙවා තිබුණි. නමුත් ආදායම් ආපසු ගෙවීමට පදනම් කරගෙන තිබුණු එම කරුණු අතරින් නිලධාරීන්ගේ වැරදි හෝ නොසැලකිල්ල හෝ හේතුවෙන් සිදුවී තිබුණු කරුණු හඳුනාගැනීමට, ඒ හේතුවෙන් ආදායම් බදු හා භාණ්ඩාගාර බදු වැඩිපුර ගෙවීම් හඳුනාගෙන ආපසු අයකර ගැනීමට හෝ වගකිවයුතු නිලධාරීන්ගෙන් අධිභාර කිරීමට හා ආදායම් ආපසු ගෙවීම් අවම කරගැනීම සඳහා පිළියම් යෙදීමට සහ මේ පිළිබඳ සියළු තොරතුරු ඇතුළත් වන පරිදි ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | රැස්කළ ආදායම් විවිධ හේතූන් මත නැවත එම පාර්ශව වෙත ආපසු ගෙවන බව, 2019 හා 2020 වර්ෂයන් තුළදී පමණක් ආපසු ගෙවීම් අවස්ථා 107 ක් තිබුණු බව, 2021 වර්ෂයේදී මෙම තත්ත්වය වලක්වා ගැනීමට භාහිර පාර්ශව මෙන්ම අභ්‍යන්තර නිලධාරින්ද වරින් වර දැනුවත් කළ බව හා එහි ප්‍රතිපලයක් ලෙස 2021 වර්ෂය තුළදී මෙම ආපසු ගෙවීම් අවස්ථා 18 ක් දක්වා අඩුකර ගත හැකි වූ බව. | ආදායම් ආපසු ගෙවීම් කිරීමට හේතු වූ සාධාරණ නොවන කරුණු හඳුනාගැනීමත්, ඒ හේතුවෙන් ආදායම් බදු හා භාණ්ඩාගාර බදු වැඩිපුර ගෙවීම් හඳුනාගෙන ආපසු අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2020 දෙසැම්බර් 31 දින වන විට ලියාපදංචිවී තිබුණු ඔසුසැල් සංඛ්‍යාව විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ඔසුසැල් 48 ක් පමණක් අධිකාරිය විසින්ද, ඔසුසැල් 23 ක් පමණක් පළාත් සෞඛ්‍ය නිලධාරී කාර්යාල විසින්ද පරීක්ෂාවට | පරීක්ෂා කර නඩු පැවරු ඔසුසල් සංඛ්‍යාව 48 ක් බව, පරීක්ෂා කරන ලද ඔසුසල් සංඛ්‍යාව මීට වඩා ඉහල සංඛ්‍යාවක් වන බව, 2020 වසර තුළ ඇඳිරි නීතිය පැනවීම, වසා තැබීම, රජයේ උපදෙස් පරිදි කුමන ආකාරයකට හෝ ඔසුසල් විවෘත කොට තබා ඖෂධ හිඟයක් ඇතිවීම වැලැක්වීමට පියවර | ඔසුසල් පරීක්ෂාවට හා අවශ්‍ය අවස්ථාවලදී නීතිමය ක්‍රියාමාර්ග |

| | | |
|---|---|---|
| ලක්කර තිබුණි. | ගැනීම තුළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු නොකිරීම, නඩු පැවරීම් සංඛ්‍යාව අඩුවීමට හේතුවක් විය. මෙම වසර තුළ විධිමත් සැලැස්මක් හා ඉලක්ක ඇතිව ඔසුසල් පරීක්ෂා කිරීම සිදුකිරීමට කටයුතු යොදා ඇත. | ගැනීමට සුදුසු වැඩ පිළිවෙළක් හඳුන්වා දිය යුතුය. |

**3.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඖෂධ ලියාපදිංචි කිරීමේ හා බලපත්‍ර ලබාදීමේ නියෝගවලට අනුව, ලියාපදිංචි ඩොසියරයක් ඇගයීමට වැඩ කරන දින 300 ක් හා ප්‍රමුඛතා පදනම මත ලියාපදිංචි ඩොසියරයක් ඇගයීමට වැඩකරන දින 180 ක්ද, ලියාපදිංචි ඩොසියරයක සම්පූර්ණත්වය පිළිබඳ මූලික පරීක්ෂණය සඳහා වැඩකරන දින 15 ක්ද වශයෙන් ගත වන බව ඉලක්කගත කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය තුළදී එකම ලිපිනයේ පිහිටි එකම නම්වලින් යුක්ත අධ්‍යක්ෂවරු දෙදෙනෙකුගෙන් සමන්විත සමාගම් 03 ක හා ඒ හා සම්බන්ධිත තවත් සමාගමක ඖෂධ ලියාපදිංචි සහතික හා සාම්පල් ආනයනය කිරීම සඳහා සහතික ලබාගැනීමට ඉදිරිපත් කර තිබුණු ඩොසියර් (Dossiers) 93 කින් ඩොසියර් 17 ක්ම ප්‍රධාන විධායක නිලධාරීගේ අනුදැනුම යටතේද, තවත් ඩොසියර් 24 ක් ප්‍රධාන විධායක නිලධාරීගේ අනුදැනුම ඇතිව හෝ නැතිවද, එක් ඖෂධවේදියෙකු විසින් දින 01 ත් දින 02 ත් තුළදී ඇගයීම් සිදුකර තිබුණි. එසේම එම ඩොසියර් නිසි ඇගයීමකට ලක්කර නොතිබුණු බව ස්වාධීන විශේෂඥ පරීක්ෂණ වාර්තාවක් මගින් තහවුරුවී තිබුණි. එම ඖෂධවේදියා විසින් 2019 වර්ෂය තුළදී වෙනත් සමාගම්වල එක් ඩොසියරයක් ඇගයීම සඳහා දින 281 ත් දින 427 ත් අතර කාලයක් ගත කර තිබුණු බවද අනාවරණය විය. තවද, තාවකාලික ලියාපදිංචිය ලබාගත් අයදුම්කරුවන් එහි වලංගු කාලය වූ වර්ෂ 02 ඉක්මවීමට මාස 06 කට පෙර නැවත ලියාපදිංචියට ඉල්ලුම් කළ යුතුය. නමුත් ඊට පටහැනිව අවස්ථා 35 කදී මෙම සමාගම් ජාලය වෙත තාවකාලික සහතික නිකුත් කර මාස 03 ක් යන විට සම්පූර්ණ සහතිකය නිකුත් කිරීමටත්, එම සම්පූර්ණ ලියාපදිංචිය ලබාදීමේ ඇගයීම් කටයුතු, පරීක්ෂා කිරීම් හා ප්‍රධාන විධායක නිලධාරී අනුමත කිරීම දින 01 ත් දින 02 ත් තුළදී සිදුකරමින් එම සමාගමට වාසිදායක වන ලෙස කටයුතු කර තිබුණි. මෙම අවිධිමත් ක්‍රියාව පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම්දී වර්ෂයකට අධික කාලයක් ගතවී තිබුණද කිසිදු විමර්ශනයක් සිදුකළ බවට හෝ එවැනි ක්‍රියාවන් නැවත සිදු නොවන ක්‍රමවේදයන් හඳුන්වා දුන් බවට තොරතුරු අනාවරණය නොකෙරුණු අතර කිසිදු විනය ක්‍රියාමාර්ගයක් නොගෙන අදාළ ඖෂධවේදීන් සිව්දෙනෙකු 2020 අගෝස්තු 12 දින සිට ක්‍රියාත්මක වන පරිදි සෞඛ්‍ය අමාත්‍යාංශයට පරිපාලන හේතු මත යැයි සඳහන් කරමින් මුදාහැර තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව, රු.500,000 ඉක්මවන භාණ්ඩ කොන්ත්‍රාත් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹිය යුතු වුවද, මුළු පිරිවැය රු.1,122,095 ක් වූ වායු සමීකරණ යන්ත්‍ර 10 ක් සපයා සවිකර ගැනීමේ කොන්ත්‍රාත්තුව හා මුළු පිරිවැය රු.2,529,540 ක් වූ ටැබ් පරිගණක යන්ත්‍ර 47 ක් මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් අදාළ සැපයුම්කරුවන් සමඟ ලිඛිත ගිවිසුම්වලට එළඹ නොතිබුණු බැවින් මෙම භාණ්ඩ සම්බන්ධ නඩත්තු කටයුතු වැනි ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකිවී තිබුණි. | ඉදිරියේදී මෙම අඩුපාඩු මගහරවා ගනිමින් නිවැරදිව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල වෙමින් ප්‍රසම්පාදන කටයුතු සිදු කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට අධිකාරිය සඳහා අනුමත මුළු සේවක සංඛ්‍යාව 257 ක් වූ අතර ඉන් ස්ථිර සේවක සංඛ්‍යාව 235 ක් හා කොන්ත්‍රාත් පදනම මත සේවක සංඛ්‍යාව 22 ක් විය. එසේ වුවද, එදිනට මුළු තත්‍ය සේවක සංඛ්‍යාව 120 ක් වූ අතර ඉන් 59 දෙනෙකුම ද්විතීයන පදනම මත තනතුරුවලට අනුයුක්ත කළ නිලධාරීන් විය. විශේෂයෙන් ඖෂධ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් වන අයදුම්පත් ඇගයීම් කටයුතුවල නිරත ඖෂධවේදීන් 45 දෙනෙකුම ද්විතීයන පදනම මත බඳවා ගත් නිලධාරීන් විය. එසේම පුරප්පාඩු සේවක සංඛ්‍යාව 182 ක් වූ අතර ඒ තුළ වූ අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, වෛද්‍ය නිලධාරී යන මාණ්ඩලික ගණයට අයත් තනතුරු සංඛ්‍යාව 12 ක් විය. තවද ඖෂධ ඇගයීම් නිලධාරී සහ සහකාර ඖෂධ නිලධාරී වශයෙන් අනුමත නව තනතුරු 70 ක් හා අනුමත රසායනාගාර සහායක තනතුරු 08 ක් පැවති නමුත් එම නව තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට 2021 ඔක්තෝබර් 07 දින වන විටත් කටයුතු කර නොතිබුණි. ඖෂධ පරීක්ෂක හා ඖෂධ විශ්ලේෂක වැනි තනතුරු පුරප්පාඩු පැවතීම, අධිකාරියේ ප්‍රධාන කාර්යය යටතට ගැනෙන ඔසුසල් අධීක්ෂණය, බලපත්‍ර නිකුත් කිරීම, ඖෂධ හා වෛද්‍ය උපකරණ ලියාපදිංචිය, ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ඖෂධවල ගුණාත්වය පරීක්ෂා කිරීම, යහපත් නිෂ්පාදන පරිචයන් (GMP) පරීක්ෂාව හා අනුමත කිරීම ඇතුළු අධිකාරියේ මෙහෙයුම් කටයුතුවල | 2022 ජනවාරි 07 දිනට අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා තනතුරු 235ක් අනුමත වී ඇති අතර, 161 දෙනෙකු සේවයෙහි නිරත වේ. ඉන් ස්ථිර කාර්ය මණ්ඩලය 111 ක් වන අතර ද්වීතියන පදනම මත ඖෂධවේදීන් ඒක් අයෙකුද වේ. සහකාර ඖෂධ ඇගයීම් නිලධාරීන් 29 දෙනෙකු බඳවා ගෙන අවසන් කර ඇත. | බඳවා ගැනීම් සහ අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය කඩිනමින් සිදුකළ යුතුය. |

කාර්යසාධනය කෙරෙහි සෘජුවම බලපෑ හැකි බව නිරීක්ෂණය විය.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 6.5.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 07 ක ප්‍රමාදයකින් පසුව 2021 සැප්තැම්බර් 16 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟවන බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 4.2 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 23 වන වගන්තිය ප්‍රකාරව, මුදල් වර්ෂය අවසන්වී මාස හයක කාලයක් ඇතුළත අමාත්‍යවරයා වෙත අධිකාරිය විසින් එම මුදල් වර්ෂය ඇතුළත සිදුකරනු ලැබූ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාවට විගණකාධිපති වාර්තාව සමඟ අදාළ වර්ෂය සඳහා වූ අධිකාරියේ විගණනය කරන ලද ගිණුම් වාර්තාව සහ එළඹෙන වර්ෂය සඳහා වූ යෝජිත කටයුතු පිළිබඳ වාර්තාවක්ද අමුණා තැබිය යුතුය. එම වාර්තාව ලද දින සිට මාස හයක කාලයක් ඇතුළත අමාත්‍යවරයා විසින් එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු වුවද, 2017 වර්ෂයේ සිටම වාර්ෂික වාර්තා පිළියෙල කර අමාත්‍යවරයා වෙත හා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2016 හා 2017 වර්ෂ වෙනුවෙන් පිළියෙල කර වාර්ෂික වාර්තා සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය වෙත භාරදී ඇති බව හා ඉදිරිපත් කිරීමේ ආකෘතිය වෙනස් කර නව ආකෘතියට අනුව එම වාර්ෂික වාර්තා සකස් කරමින් පවතින බව. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4.3 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම , ප්‍රසම්පාදන සැලැස්ම හා වාර්ෂික අයවැය ලේඛනය එකිනෙකට සමගාමීව පිළියෙල කළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි. | මෙම සැලැසුම් විධිමත්ව පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා වාර්ෂික අයවැය ලේඛනය එකිනෙකට සමගාමීව පිළියෙල කළ යුතුය. |

## 4.4 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කර තිබුණු 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත ආයතන විසින් දිගුකාලීන දැක්මක් සහිතව අදාළ පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම ඉලක්ක කරගත්, ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, අදාළ වර්ෂය සඳහා අයවැය ලේඛනය හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරිය විසින් ක්‍රියාකාරී සැලැස්මේ කෙටුම්පතක් පමණක් පිළියෙල කර තිබුණු අතර ඒ තුළ එම කරුණු ඇතුළත්ව නොතිබුණි. | මෙම සැලැස්ම විධිමත්ව පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු කෙටුම්පත් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණු අතර රු.මිලියන 576 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු ක්‍රියාකාරකම් 05 ක් ආරම්භ කිරීමට හෝ අපොහොසත්වී තිබුණි. එය රු.මිලියන 700 ක් වූ මුළු වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සියයට 82 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය පසුව වෙනස්කර තිබීම, නව වාහන මිලදී ගැනීම නවතා ඒ වෙනුවට ජනාධිපති කාර්යාලයෙන් වාහන 3ක් පරිත්‍යාග කිරීම, ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ රසායනාගාරය විසින් නියමිත පිරිවිතර ලබා නොදීම, හා 2020 වර්ෂයේදී පැවති කොරෝනා වසංගතය වැනි කරුණු හේතුවෙන් මෙම වැඩසටහන් ක්‍රියාත්මක නොවූ බව. | ක්‍රියාකාරී සැලැස්ම යථාර්තයක් බවට පත්කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4.5 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය"හා 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශක හඳුනාගත යුතු වුවද, අධිකාරිය විසින් එවැනි දර්ශකයන් හඳුනාගෙන අරමුණුවලින් ළඟාකරගත් ප්‍රමාණය හා බැහැරවීම් මෙන්ම අවධානය යොමු කළයුතු විවිධ ක්ෂේත්‍රයන් හඳුනාගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් පිළිබඳව විධිමත් අවධානය යොමු කරමින් කටයුතු කරන බව. | තිරසාර සංවර්ධනය අරමුණු සඳහා ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් සඳහා සුදුසු දර්ශක හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |